මගේ අංකය :- JSC/SPO/EB/2023(2025)

සියලුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් /අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10:10 හා 15.3.1 වගන්ති වල සහ " ඌ " පරිශිෂ්ඨයෙහි 01.2 වන වගන්තියේ දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශ අනුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොළඹදී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක සේවයේ III වන ශ්‍රේණියේ 2023.12.31 දිනට පෙර පත්වීම් ලද නිලධරයන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- අධිකරණ කළමනාකරණ සහකාර සේවාවේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | පරිවර්තනය | පැය 02 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|---|
| 01 | පරිවර්තනය | (1) සිංහල/ඉංග්‍රීසි භාෂාවට ඉංග්‍රීසි/සිංහල භාෂාවට | පැය 02 |
| | | (2) සිංහල/දෙමළ භාෂාවට දෙමළ/සිංහල භාෂාවට | පැය 02 |
| | | (3) දෙමළ/ඉංග්‍රීසි භාෂාවට ඉංග්‍රීසි/දෙමළ භාෂාවට | පැය 02 |

(අයදුම්කරුවන්ගේ පත්වීම අනුව ඉහත 1,2,3 ප්‍රශ්න පත්‍ර අතුරින් අදාල ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය.)

04. මෙම පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලබා ගැනීම සඳහා අපේක්ෂකයින් 40%ක අවම ලකුණු ලබා ගත යුතුය.

05. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකදු වුවත් ඉන්පසු වාර වලදී නිලධරයන් විසින් සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 250/- ක් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම් කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වකාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. මෙම විභාග ගාස්තු " අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් " නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයෙන් වෙන් කර ගැනීමට හැකිවන පරිදි අමුණා එවිය යුතුය.

07. මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ X 8 ½ ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග 2025 නොවැම්බර් 28 වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023" යනුවෙන් සඳහන් කළ යුතුය.

08. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියළුම නිලධාරින්ට දැන්වීමට කටයුතු කරන්න.

සටහන - උපලේඛනගත රජයේ නිලධරයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ 15.3.1 වගන්තිය පහත පරිදි වේ.

**15.3.1 "නියමිත දිනට අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවන්ට අයත්) නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය."**

උද්දාල සුවන්දුරුගොඩ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

**උද්දාල සුවන්දුරුගොඩ**
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්**
**අධිකරණ සේවා කොමිෂන් සභාව**
**කොළඹ 12**

අත්/කලේ: ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2025 ඔක්තෝබර් මස 17 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

## SPECIMEN APPLICATION FORM

## Efficiency Bar Examination for Officers in Court Interpreter Grade III of the Court Management Assistant's Service - 2023

01. Name:

1:1 Name with initials Mr./Mrs./Miss:......................................................................................................
(In block capital letters)

1:2 Full Name: .......................................................................................................................
(In block capital letters)

1:3 Full Name:........................................................................................................................
(In Sinhala/Tamil)

02. National Identity Card Number:.............................................................................................

03. Address:

3:1 Permanent Address:..........................................................................................................
(In block capital letters)

3:2 Official Address:...............................................................................................................
(In block capital letters)

04. Contact Details

4:1 Mobile No:.........................................................................................................................

05. Date of Birth: Date ___ Month ___ Year___

06. Personal File No: EA/PF/2/______

07. Date of appointment to the post of Court Interpreter Grade III : ......................

08. The category of Interpreter into which the applicant has been recruited

(I) Sinhala/English ☐

(II) Sinhala /Tamil ☐

(III) Tamil/ English ☐

(Denote with "S/E" for Sinhala/English,"S/T" for Sinhala /Tamil, "T/E" for Tamil/ English)

09. Please give details of subject and years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I. |
| | I |

10. Subject / Subjects you are now offering to sit for

(i) ............................................

(ii) ............................................

11. (i) The value of payment made as Examination fee:..........................................................................

(ii) Name of the Bank and the Branch to which the payment was made:.........................................

(iii) Number and date of the receipt:..................................................................................................

| Affix the receipt here. |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the Examination in the category mentioned in the paragraph 8 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to be bound by the rules and regulations of the Secretary to Judicial Service Commission regarding conducting of the examination.

................................ Date

........................................ Signature of the Applicant

Note: Applicant should sign before the Head of the Department/ Registrar of the relevant court.

---

I hereby certify that Mr./Mrs./Miss.......................................................................................................................... Who is a Grade III Court Interpreter is personally known to me and signed before me on..............................

........................................ Signature of the Registrar

Date: ......................................

Name: ....................................

Designation: ............................

Address: ..................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.

02. The officer sits for this Examination for the first time/ has made the correct payment as Examination Fee.

03. The applicant is eligible to sit for this Examination.

Designation: ...........................

Date: ......................................

........................................ Signature of the Head of the Department